# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 48 — 1973 පෙබරවාරි 23 වැනි සිකුරාදා — 1973.02.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 243 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 255 |


**සැලකිය යුතුයි.**—ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය පනත් කෙටුම්පත සහ මුදල් හා ලංකා රජයේ උකස් බැංකු සංශෝධන) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 09 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේක වශයෙන් පළ කරන ලදී.

# තනතුරු – ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙසු අයට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

වශයෙන් වෘත්තීය සුදුසුකම් ඇති අපේක්ෂකයෙකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 8,520 ආරම්භ වැටුප ලැබීමට සුදුසු වේ.

(ii) මහා බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ සාමාජිකත්වය ලබා ගන්නා තෙක් ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 11,520 වැටුප් පියවරෙන් ඔබ්බට උසස් වීමට නිලධාරියෙකුට හැකි නොවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරනු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1973. 03. 15 දිනට තම වයස අවුරුදු 20 කට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි බව. (දැනට රජයේ සේවයේ සිටින අයට මෙම උපරිම වයස් සීමාව බලපවත්වනු නොලැබේ.)

(ඇ) (i) රසායන විද්‍යාව පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පෙළ ගෞරව උපාධියක් ලත් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු, හෝ

(ii) මහා බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ සාමාජිකත්වය ලද්දකු බව.

**සැලකිය යුතුයි.**—ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා ගෞරව උපාධි විභාගයේ ප්‍රතිඵල බලාපොරොත්තු වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ද භාරගනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් වී සතියක් ඇතුළත තමන්ගේ සමර්ථ අසමර්ථ තාවය හා සාමාර්ථය ලැබුවේ නම් පළමුවැනි පෙළ හෝ දෙවෙනි පෙළ හෝ ගෞරව පන්තියක් ලබා තිබේදැයි යන්නත් මා වෙත ලියා දැන්විය යුතුයි. නොඑසේ නම් ඔවුන්ගේ ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතු ය.—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.-අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.,

(ඈ) වෘත්තිය/සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඉ) සිංහල, දෙමළ හා ඉංගිරිසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැලකිය යුතුයි :—**

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිනිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය. එතෙකුදු උවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ අධිකරණ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධිකරණ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නාමය පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ (ii අ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරවනු ලැබේ.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973 පෙබරවාරි මස 07 දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දීය.

2–794—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### පුහුණු හෙදි තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුහුණු හෙදි (Qualified Nurses) තනතුරු සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1973 මාර්තු මස 16 වෙනිදාට හෝ ඊට පෙර මා වෙත එවිය යුතුය.

2. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරු සඳහා රු. 5,736 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සහිතව රු. 3,864—144—රු. 6,456 ක ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමිය. මීට අමතරව වර්ෂයකට රු. 60 ක සේදීම් දීමනාවක් හා රු. 30 ක සපත්තු දීමනාවක් ගෙවනු ලැබේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්වීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සියළුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුය :—

(i) 1973 මාර්තු මස 16 දාට වයස අවුරුදු 18 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(ii) පුහුණු හෙදියන් වශයෙන්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලත් සහතිකයක් අනුව 1919 අංක 10 දරණ සෞඛ්‍ය සංශෝධන ආඥාපනත (මැඩිකල් කවුන්සිල්) "ඒ" කොටස යටතේ ලියාපදිංචි වූවකු විය යුතුය. (හෙදි සහතිකයත් සමග සූතිකර්මය ගැන සහතිකයක් ලබා සිටින අය ගැන විශේෂයෙන් සළකා බලනු ලැබේ.)

5. අයැදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්වලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික භාරගනු නොලැබේ,)

(ආ) ලබා ඇති අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික. (පිටපත්)

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික 3 ක්. (පිටපත්)

6. සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්, 'ආයුර්වේද කොම සාරිස් තැන, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කොළඹ 8.' කියා එවිය යුතුය. කිසිම අයැදුම්පතක් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නො එවිය යුතුය.

7. මේ පිළිබඳව රජයේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ, (IIඅ) වැනි ඡේදයේ සඳහන් පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලන්න.

සැලකිය යුතුයි.—ඉල්ලුම්පත්‍ර සමග අමුනා එවන කිසිම ලියවිල්ලක් ආපසු එවනු නොලැබේ. ඉහත සඳහන් සම්පූර්ණ සුදුසුකම් නොමැතිව ඉදිරිපත් කරන හා අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කෙරෙන අයැදුම්පත් කෙලින්ම ප්‍රතික්ෂේප කරන අතර, ඒ පිළිබඳව කරනු ලබන විමසීම් වලට පිළිතුරු සැපයීම් කළ නොහැකි බව ද, මෙයින් දන්වනු ලැබේ.

පී. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973 පෙබරවාරි මස 09 වෙනි දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

### ආදර්ශ ආකෘති පත්‍රය

### පුහුණු හෙදි තනතුර—ආයුර්වේද දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා 1973 මාර්තු 16 දිනට වයස (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
4. ජාතිය :————.

5. විවාහක නම් :—

(අ) විවාහයට පළමු තිබූ නම :————.

(ආ) ස්වාමි පුරුෂයා ජීවත්ව සිටිනවාද ? :————.

(ඇ) (1) ස්වාමි පුරුෂයා සමඟ ජීවත්වෙනවාද ? :————.

(2) නීති ප්‍රකාර වෙන්වී තිබේද ?

(3) එසේ නොමැතිව වෙන්වී තිබේද ? :————.

(4) ස්වාමි පුරුෂයාගේ රක්ෂාව :————.

(5) ඔහු සේවය කරනුයේ කොහිද ? :————.

(6) දරුවන්ගේ ගණන :————.

මැඩිමලාගේ වයස :————.

බාලයාගේ වයස :————.

6. දැනට සේවයේ යෙදී සිටින්නේ නම් :————.

(අ) ස්ථානය :————.

(ආ) කොතෙක් කල් සේවය කෙළේද ? :————.

7. අධ්‍යාපනය ලත් පාසැල සහ සාමාර්ථය ලත් විභාග :————.

8. සාත්තු සේවය පිළිබඳ අභ්‍යාස ලද්දේ ද ? කොහිදී ද ? : ————.

9. සූතිකර්මය පිළිබඳ අභ්‍යාස ලැබුවෙහිද ? (සහතික පත්‍රයේ පිට පතක් ඇමිණිය යුතුය) :————.

10. මෑතදී ගන්නා ලද චරිත සහතික පත් 3 ක් (පිටපත් අමුණන්න) :————.

11. පියාගේ හෝ භාරකාරයාගේ ලිපිනය :————.

12. සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිළිබඳ දැනුම් :—

සිංහල :————.

දෙමළ :————.

ඉංග්‍රීසි :————.

13. හෙදියන් මීට පෙර රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර හා එම සේවයෙන් අස්වූයේද ? හැර ගියේද ? පහ කළේද යන්න :————.

14. හෙදියන් වශයෙන් ලියාපදිංචි වී ඇති අංකය (සහතික පිටපතක් අමුණන්න) :————.

මීට පෙර රජයේ සේවයෙන් හෝ වෙනත් ආයතනයකින් හෝ අකාර්යක්ෂමතාවය උඩ විශ්‍රාම ගෙන හෝ සේවයෙන් පහ නොකළ බවත්, නීති ප්‍රකාර, දඬුවම් නොලැබූ බවත්, මෙයින් සහතික කරමි. එමෙන්ම මෙම ඉල්ලුම්පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා ඇති බව ඔප්පු වුවහොත් වහාම මා සේවයෙන් පහ කරනු ලබන බව ද, දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–820—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර**

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කර 1973 මාර්තු මස 16 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමාණය රුපියල් 4,152—17 × 144 සහ 4 × 180 රු. 7,320 වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :—**

(අ) මෙම තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගන්නා අපේක්ෂකයා රජයේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) රජයේ ස්ථිර නිලධාරියකු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු පළමුවෙන්ම නියමිත කාලයකට වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(1) **උසස් කරනු ලබන්නවුන් සඳහා :—**

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් යුත් අධ්‍යයන පොදු සහතික හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

සහ

(ආ) (i) ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ගෘහ කර්මාන්ත වෙළඳ සැලක සහකාර කළමනාකාර තනතුරේ අවුරුදු 3 කට නො අඩුවූ සේවා කාලයක් තිබිය යුතුය.

හෝ

(ii) ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පරිපාලක තනතුරක සතුටුදායක ලෙස අවුරුදු 5 කට නො අඩු අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

සටහන.—වාණිජ හා අලෙවි කටයුතු පිළිබඳ ගැටළු අතින් දැනීමක් සහ පළපුරුද්දක් ඇති අය ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(2) **කෙළින්ම බඳවාගන්නවුන් සඳහා :—**

(අ) වාණිජ ඩිප්ලෝමා සහතික පත්‍රය සඳහා වූ දෙවැනි විභාගය, හෝ

(ආ) ලේකම්වරුන්ගේ චාර්ටඩ් ආයතනයේ මධ්‍ය (ඉන්ටර්) විභාගය, හෝ

(ඇ) පොත්තබන්නන් සඳහා වූ උසස් සහතික විභාගය හෝ සමත්ව සිටිය යුතුය.

**සටහන :**

විශාල වෙළඳ ව්‍යාපාරික ආයතනයක කළමනාකරුවකු හෝ පරිපාලකයකු වශයෙන් පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(3) සෑම අයදුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973. 03. 16 දිනට වයස අවුරුදු 25 ට නො අඩු සහ අවුරුදු 45 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව අදාල නොවේ).

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ).

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

**සංලක්ෂ්‍යය :** (i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපත් නො ඇමිණිය යුතුය.

(ii) ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් නැත සලකා බලනු නොලැබේ.

6. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩලය යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්කරුවන් ස්වකීය වියදමින්ම කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතුය.

8. අයදුම්පතේ ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම සොයාගතහොත් අයදුම්කරු නුසුදුස්සකු කිරීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු සොයා ගතහොත් සේවයෙන් පහ කිරීමට ද සිදුවනු ඇත.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූද කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරීත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජනවාරි මස 26 දින,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
ගේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.

## තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපන හා/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.
9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳව විස්තර සඳහන් කරන්න :————.
10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදිංචි නාම :————.

මෙම අයදුම්පතෙහි දැක්වෙන සියලු විස්තර සත්‍ය බවද, නිවැරදි බවද මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ පත්වීම් දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂත්වය අවලංගුවීමටද, පත්වීම ලැබුවාට පසු හෙළිවුවහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමටද යටත්වන බව මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–795—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
## කනකපුල්ලේ තනතුර

ඩාටන්ෆීල්ඩ් වතුයායේ කොට්ඨාශවලින් එකක සේවය කිරීම පිණිස කනකපුල්ලේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ලංකා වතු සේවක සංගමය මගින් එකඟත්වයට එළැඹී තිබෙන සේවා කොන්දේසි යටතේ තෝරාගනු ලබන ඉල්ලුම්කරුව තබනු ඇත.

**සුදුසුකම්.**—අ. පො. ස. (සා. පෙ.) විභාගය සිංහලයෙන් භයකින් එකවර සමත්වී තිබිය යුතු අතර, කිරි කැපීම සහ බර මැනීම ගැන විශේෂ පළපුරුද්දක් සහිතව සියළුම රබර් වගා කටයුතු පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 3ක පළපුරුද්දක් තිබිය යුතුය. සාක්කු චැක් රෝල් සහ වෙනත් ක්ෂෙත්‍ර සටහන් තබාගැනීමේ හැකියාවක් ද තිබිය යුතුයි. වයස අවුරුදු 25කට අධික නොවිය යුතුයි.

**වැටුප.**—මසකට රු. 75—රු. 6—රු. 105.

**වෙනත් කොන්දේසි යනාදිය.**—කනකපුල්ලේ වරුන්ට අදාළ වන කොන්දේසි අනුව ජීවනාධාර මුදල්, අර්ථ සාධක අරමුදල් යනාදිය ගෙවනු ලැබේ. තෝරාගනු ලබන ඉල්ලුම්කරුට මෙම ආයතනයට අයිති කුමන පර්යේෂණ ස්ථානයකට හෝ මාරුකළ හැකිය. තවද, ඔහු විසින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතුය. ස්වකීය අත්දැකීම සහ සුදුසුකම් අනුව මෙම වැටුප් පරිමාණයේ සංලක්ෂ්‍යයක තෝරා ගනු ලබන ඉල්ලුම්කරුව තබනු ඇත.

අයදුම් පත් අයදුම්කරුවන්ගේම අත් අකුරින් පිරවිය යුතු අතර, පහත සඳහන් තොරතුරු ඊට අඩංගු විය යුතුය.
(1) සම්පූර්ණ නම, ලිපිනය, වයස සහ විවාහක අවිවාහක යන වග,
(2) අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර.
(3) සේවායයන්ගේ නම් සහ ලිපිනයන් ඇතුළත් වත්මන් සහ පසුගිය රැකියාවන් පිළිබඳ විස්තර (වැටුප්, කාර්ය භාරයන්, යනාදිය සහ රැකියාව හැරයාමට හේතූන් දක්විය යුතුයි).

සහතික පත්‍ර සහ චරිත සහතික්වල පිටපත් සමඟ යථෝක්ත තොරතුරු ඇතුළත් අයදුම් පත්, 1973 මාර්තු 16 වෙනි දිනට හෝ ඊට පෙර අගලවත්තේ ඩාටන්ෆීල්ඩ් ලංකා රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි "කනකපුල්ලේ" යන්න සඳහන් කළ යුතුයි. මෙම තනතුර සඳහා අයථා මාර්ග භාවිතා කිරීමෙන් අයදුම්කරු නුසුදුසු අයකු බවට පත්වේ.

ආයතනය මගින් හෝ එය වෙනුවෙන් ඉල්ලුම් පත්‍රිකා කිසිත් නිකුත් කරනු නොලැබේ.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය,
ඩාටන්ෆීල්ඩ්,
අගලවත්ත,
1973.02.07.

2–851—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ ගැමුණුපුර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මන්මුනේ පත්තු උතුර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

ගැමුණුපුර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සෑහෙන දේපළක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලා ගත හැකිය.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1973. 03. 23 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1973 පෙබරවාරි මස 9 දින,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

2–899—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ ගැමුණුපුර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ ඒරාවූර් සහ කෝරළපත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවීම පිණිස අංක 43 හා 1973. 01. 19 වෙනි දින දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම් මෙයින් අවලංගු කර ඇත.

1973 පෙබරවාරි මස 9 දින,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

2–900—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

### ආදර්ශ ආකෘති පත්‍රය

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ පුහුණු I ශ්‍රේණියේ ............ ............................තනතුර සඳහා ඉල්ලුම් පත

1. (i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :———.
 (ii) මුලකුරු සහිත නම :———.
2. තැපැල් ලිපිනය :———.
3. (i) උපන් දිනය :———.
 (ii) 1973.03.01 දිනට වයස :—අවු :——, මාස :——, දින : ——.
4. ජාතිය :———.
5. විවාහකද අවිවාහකද යන වග :———.
6. අධ්‍යාපන සුදුසුකම් :———.
7. වෘත්තීය සුදුසුකම් :———.
8. පාසැලින් අස්වූ පසු කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :—
 (i) ආයතනයේ නම :———.
 (ii) පත්වූ දිනය :———.
 (iii) දැරූ තනතුර :———.
 (iv) සේ. අ. අරමුදලේ සාමාජිකයෙක් නම් :—
  (i) ස්වාමියාගේ අංකය :———.
  (ii) සාමාජිකයාගේ අංකය :———.
 (v) විශ්‍රාමලාභී ආයතනයකද යන වග :———.
 (vi) අස්වූ දිනය හා අස්වීමට හේතූන් :———.
9. වෙනත් සුදුසුකම් (ඇතොත්) :———.
10. සඳහන් කිරීමට කැමති වෙනත් විස්තර :———.

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරන අතර, මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පත් කිරීමට කලින් දැනගත හොත් මා නුසුදුස්සකු විය හැකි බව හා තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා වහාම සේව යෙන් පහ කර දමනු ලැබීමට යටත් බවත් දැන මෙහි පහත අත්සන් තබමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

2–917—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### ධීවර දෙපාර්තමේන්තුව

#### මත්ස්‍ය පෝෂ්‍ය විද්‍යාඥ තනතුරු

ධීවර දෙපාර්තමේන්තුවේ මත්ස්‍ය පෝෂ්‍ය විද්‍යාඥ තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 3, ගාළු මුවදොර ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973 මාර්තු මස 30 වෙනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1973 මාර්තු මස 30 වෙනිදා.

**සටහන් :**

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිත යාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවියයුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුය. පත්වීම ලබන අවස්ථාවේදී නිලධාරියා විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇතිව සිටියේ නම් ඔහුට තවදුරටත් එම හිමිකම් භුක්ති විඳිය හැකිය.

(ආ) මේ නිලධාරියාට අතිරේක පුහුණුවක් හා පළපුරුද්දක් ලබා ගනු සඳහා පිටරට යාමටද සිදුවිය හැකිය.

(ඇ) පිටරට පුහුණු කරවීම පිණිස මේ නිලධාරියා තෝරාගනු ලැබුව හොත් එවිට පහත සඳහන් දේ පිළිබඳව ඔහු ශ්‍රී ලංකා ජන රජය සමග ගිවිසුමකට පැමිණිය යුතුය.

ඇ(i) අනිකුත් දේ අතර නියමිත පුහුණුවීමේ පාඨමාලාවන් විශ්වාසදායක ලෙස අප්‍රමාදව හැදෑරීමටත්, එය සතුටු දායක ලෙස නිම කිරීමටත්, පුහුණුව නිමකිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, නියමිත කාලසීමාවකට (ජන රජය විසින් නියම කළ යුතුවූ) ශ්‍රී ලංකා ජනරජයේ සේවය කිරීමටත් භාර ගැනීම, හා

ඇ(ii) ගිවිසුමේ වගන්ති හා කොන්දේසි අනුව, කටයුතු නොකළහොත් (වැටුප් දීමනා, ගමන් වියදම් ගාස්තු ආදිය) සම්පූර්ණ පුහුණුව සඳහා ශ්‍රී ලංකා ජනරජය හා/හෝ අනිකුත් ප්‍රදානය කිරීමේ ආයතනයක් මගින් දරන ලද පුහුණුවීමේ මුළු වියදම ආපසු ශ්‍රී ලංකා ජන රජයට ගෙවීමට භාර ගැනීම.

**3. වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය : රු. 6,720—12×360 සහ 7×480—14,400. රු. 7,800 සහ 11,520 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1973. 03. 30 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ සිටින නිලධාරීන්ට වයස් සීමාව බලනොපානු ඇත.)

(ඇ) සත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ විෂයයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ විද්‍යා උපාධිය. ධීවර ජීව විද්‍යා හෝ සාගර විද්‍යා ක්ෂෙත්‍රයෙහි හෝ වෙනත් ජලතර සත්ව පෝෂණ (acquaculture) ක්ෂෙත්‍රයෙහි හෝ පුහුණුව ලැබූ (හෝ ඒ හා ආශ්‍රිත දැනුමක් ලැබූ) උපාධිධාරී නට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මෙම ක්ෂෙත්‍රයෙහි පුහුණුව ලබා ඇති හා මත්ස්‍ය පෝෂ්‍ය කටයුතුවල අවම වශයෙන් අවුරුදු 15ක පළපුරුද්දක් ඇති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අධ්‍යාපනික සුදුසුකම් නොතකා මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) තනතුරට පත්වීම සඳහා අයදුම්කරුගේ අධ්‍යාපනික සුදුසුකම්, චරිතය හා සුදුසුකම් දක්වෙන මෑතකදී ලබාගත් සහතික 3 ක් (දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන්ට මෙම අනුඡේදය යටතේ අපේක්ෂිත සහතික අවශ්‍ය නොවේ.)

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(1) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(2) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එවීවේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර ධීවර අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ධීවර අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනිකොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත එම අයදුම්පත ලැබුන බව දන්වනු ලැබේ. එසේ දන්වීමක් නොලැබෙන විට ඒ බව වහාම ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්විය යුතුය.

ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ 3, ගාළු මුවදොර,
ධීවර අමාත්‍යාංශයේ දීය.

**මත්ස්‍ය පෝෂ්‍ය විද්‍යාඥ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "මත්ස්‍ය පෝෂ්‍ය විද්‍යාඥ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 3, තැ. පෙ. අංක 1707 ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.
(1973 දිනට වයස :— අවුරුදු :————, මාස :—— ——, දින :—— ——.)

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. වෘත්තිය සුදුසුකම් :————.

8. පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ ගැදෑරු අභ්‍යාස පිළිබඳ විස්තර :————.
(සේවය භාරගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය.)

9. දැනට කරන රක්ෂාව :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නම් :————.

11. වෙනත් සුදුසුකම් :————.

මවිසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට බැඳී ඇති බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–931—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

**දෙමළ මාධ්‍ය පාසල්වල ඉංග්‍රීසි උගැන්වීම සඳහා දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතික පත්‍ර නොලත් උපගුරුවරුන් බඳවාගැනීම**

රජයේ දෙමළ මාධ්‍ය පාසල්වල සහතික පත්‍ර නොලත් ඉංග්‍රීසි උපගුරු තනතුරු සඳහා ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත්‍ර පිළියෙල කොට 1973 මාර්තු මස 23 වන දින හෝ ඊට ප්‍රථම තමා පදිංචිව සිටින අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරී වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'සහතික පත්‍ර නොලත් ඉංග්‍රීසි උපගුරු තනතුර-දෙමළ මාධ්‍ය පාසල් යන්න' පැහැදිළිව සඳහන් කළ යුතුය.

2. අධ්‍යාපන දිස්ත්‍රික්ක භාර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිවරයාගේ ලිපිනය පහතින් දක්වේ.—

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිවරයාගේ ලිපිනය |
|---|---|
| අනුරාධපුරය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුරය. |
| අම්පාර | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, අම්පාර. |
| බණ්ඩාරවෙල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල |
| මඩකලපුව | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මඩකලපුව. |
| කොළඹ දකුණ | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ දකුණ. |
| හෝමාගම | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, හෝමාගම. |
| ගම්පහ | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගම්පහ. |
| කළුතර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කළුතර. |
| හලාවත | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, හලාවත. |
| ගාල්ල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගාල්ල. |
| යාපනය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, යාපනය. |
| මහනුවර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මහනුවර. |
| කුරුණෑගල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කුරුණෑගල. |
| කෑගල්ල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කෑගල්ල. |
| කල්මුනේ | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, කල්මුනේ. |
| මාතර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මාතර. |
| මොණරාගල | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මොණරාගල. |
| මාතලේ | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මාතලේ. |
| මන්නාරම | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මන්නාරම. |
| නුවරඑළිය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නුවරඑළිය. |
| පොළොන්නරුව | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, පොළොන්නරුව. |
| රත්නපුරය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, රත්නපුරය. |
| තංගල්ල | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, තංගල්ල. |
| ත්‍රිකුණාමලය | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, ත්‍රිකුණාමලය. |
| වව්නියාව | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, වව්නියාව. |

**සටහන.**—පදිංචිය ඔප්පු කිරීම සඳහා තමා පදිංචිව සිටින ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක පිටපතක් අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

3. **සේවයේ යෙදීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—(අ) (i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය.

(ii) පත්කරනු ලබන අපේක්ෂකයන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) ආධුනික කාලය අවුරුදු 3 කි.

(iv) පත්වීම ලබන්නා විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවේ යෙදවීම සඳහා ද සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, පරිපාලන හා ආයතන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධානයන් සහ රජය විසින් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

(ආ) පත්වීම දෙනු ලබන්නේ දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ වන අතර, පත්වීම් ලබන්නන් ඔවුන් පත් කරනු ලැබූ දිස්ත්‍රික්කවල ස්ථිර වශයෙන් ම සේවය කිරීමට යටත් වේ. කිසිදු හේතුවක් නිසා පත් කරනු ලැබූ දිස්ත්‍රික්කයෙන් පිටත වෙනත් දිස්ත්‍රික්කයකට මාරුවීමක් ලබා ගැනීමට ඔවුන්ට හිමිකමක් නැත. කෙසේ වෙතත් පත් කරනු ලැබුවකු විනයානුකූල හේතූන් මත හා සේවයේ අවශ්‍යතා උඩ වෙනත් දිස්ත්‍රික්කයකට මාරු කර යැවීමේ අයිතිය දෙපාර්තමේන්තුව සතුව පවතී.

4. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට—රු. 2,700—21 × 60—රු. 3,960 (වර්ෂයකට රු. 2,880 ට සහ රු. 3,360 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත) වේ. (කල්පිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 792—21 × 42—රු. 1,674 (වර්ෂයකට රු. 918 ට හා රු. 1,254 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත) වේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇය පහත සඳහන් කරුණුවලින් යුක්ත වන බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය:—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින්ද යුක්තව සිටින බව ;

(ආ) 1973.3.23 දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ අවුරුදු 35 ට වැඩි හෝ නොවන බව ;

(ඇ) පහත සඳහන් සුදුසුකම් හෝ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය :—

(i) සම්මාන සාමාර්ථ දෙකක් සහිත ඉංග්‍රීසි මාධ්‍යය ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය,

හෝ

(ii) ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් හතරක සාමාර්ථය ද සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් හතරක සාමාර්ථය සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක සාමාර්ථය සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ). සාමාර්ථය ලබා ඇති විෂයයන් හය අතර ඉංග්‍රීසි භාෂාව, සිංහල භාෂාව/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය ද විය යුතු අතර, සම්මාන සාමාර්ථ දෙකක් ද තිබිය යුතු ය.

හෝ

(iii) ඉංග්‍රීසි භාෂාව හා ඉංග්‍රීසි සාහිත්‍යය ද සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි සාහිත්‍යය, සිංහල භාෂාව/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් ලබා ගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) සාමාර්ථය ලබා ඇති විෂයයන් අතර, සම්මාන සාමාර්ථ දෙකක් ද තිබිය යුතු ය.

හෝ

(iv) ඉංග්‍රීසි මාධ්‍ය ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල භාෂාව/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (සම්මාන සාමාර්ථ දෙකක් ද තිබිය යුතු ය.)

හෝ

(v) සිංහල/දෙමළ මාධ්‍ය ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ වාර දෙකකට නො වැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී පහත සඳහන් සාමාර්ථයන්ද සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (සම්මාන සාමාර්ථ දෙකක් ද තිබිය යුතු ය.) :—

(අ) සිංහල භාෂාව/දෙමළ භාෂාව සාමාර්ථය සහ ඉංග්‍රීසි භාෂාව 'අ' නිර්දේශයට සම්මාන සාමාර්ථයක්, හෝ

(ආ) සිංහල භාෂාව/දෙමළ භාෂාව සාමාර්ථය සහ ඉංග්‍රීසි භාෂාව 'අ' නිර්දේශයට සාමාන්‍ය සාමාර්ථයක් හා ඉංග්‍රීසි සාහිත්‍යයට සාමාර්ථයක්, හෝ

(ඉ) සිංහල භාෂාව/දෙමළ භාෂාව සාමාර්ථය සහ ඉංග්‍රීසි භාෂාව 'ආ' නිර්දේශයට සම්මාන සාමාර්ථයක් හා ඉංග්‍රීසි සාහිත්‍යයට සාමාර්ථයක්, හෝ

(vi) ඉංග්‍රීසි භාෂාව 'අ' නිර්දේශයට සාමාර්ථය හෝ 'ආ' නිර්දේශයට සම්මාන සාමාර්ථය ද සහිත සිංහල/දෙමළ මාධ්‍යය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය හෝ ඉංග්‍රීසි භාෂාව 'අ' නිර්දේශයට සාමාර්ථය හෝ 'ආ' නිර්දේශයට සම්මාන සාමාර්ථය සහ සිංහල භාෂාව/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන්ට සාමාර්ථය ද ඇතිව වාර දෙකකට නො වැඩි වාර ගණනක දී විෂයයන් හයකින් ලබාගත් සිංහල/දෙමළ මාධ්‍ය අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ). සාමාර්ථය ලබා ඇති විෂයයන් අතර සම්මාන සාමාර්ථ දෙකක් ද තිබිය යුතු ය.

සටහන :—(i) 1969 දී හා ඉන් පසුව ඉංග්‍රීසි භාෂාවෙන් ලබා ගන්නා ලද සාමාර්ථය ඉන් පෙර විභාගවල දී ඉංග්‍රීසි භාෂාව 'අ' නිර්දේශයේ සාමාර්ථයක තත්ත්වයෙහි ලා සලකනු ලැබේ.

(ii) ඉහත සඳහන් කර ඇත්තේ මෙම තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීමේ අඩුම අවශ්‍යතාවයන් වේ. අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව ව්‍යවහාර කිරීමේ ඉතා හොඳ දැනුමක් තිබිය යුතු ය.

(iii) ඉහත (vi) වැනි වගන්තිය යටතේ සඳහන් වන සුදුසුකම් අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත්වීම් ලැබීමට පෙර තුන් මසක පුහුණුවක් ලැබිය යුතු ය. පත්වීම් දෙනු ලබන්නේ එම පුහුණුව සාර්ථකව අවසන් කිරීමෙන් පසු පවත්වනු ලබන විභාගයකින් සමර්ථ වීමෙන් පසුව ය.

(ඈ) ඇබෑර්තු ඉතා වැඩි සංඛ්‍යාවක් පවතින්නේ දුර බැහැර ප්‍රදේශවල බැවින් සුදුස්සන් තෝරා ගැනීමේ දී පිරිමි අයදුම් කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඉ) අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඔවුන්ගේ ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතු ය:—

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතිකය,

(iii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,

(iv) අයදුම්කරු පදිංචිව සිටින ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

**සටහන.**—ඉහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ඉල්ලුම් පත්‍ර සහ අනිකුත් අදාළ ලියකියවිලි මෙම නිවේදනයේ I වැනි ඡේදයේ පරිදි එවිය යුතු අතර අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවල කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතු ය.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ පොදු කොන්දේසි කෙරෙහි ද අවධානය යොමු කරවනු ලැබේ.

8. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නො ලැබේ.

9. තැපැලේදී සිදුවිය හැකි කවර ප්‍රමාදයක් හෝ මග හැරවීම සඳහා සිය ඉල්ලුම් පත් කල්වේලා ඇතිව ලියාපදිංචි තැපැලෙන් එවන ලෙස ඉල්ලුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**දෙමළ මාධ්‍ය පාසල්වල ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතික පත්‍ර තොලත් උපගුරු තනතුරු**

ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය ..........................................

1. මුලට පෙළපත් නාමය සහිත සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. (i) ස්ථිර ලිපිනය :————.

(ii) ඡන්ද කොට්ඨාශය :————.

3. ඡන්දදායකයෙකු වශයෙන් ලියාපදිංචි වී ඇත්නම් අදාල ඡන්දදායක කොට්ඨාශය :————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය : ————.

5. ඉල්ලුම්කරු ජ්‍යෙෂ්ඨ/අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත් වූ පාසල :————.

6. විවාහක ද, අවිවාහක ද යන බව :————.

7. උපන් දිනය හා ස්ථානය :————.

8. 1973. 3. 23 දිනට වයස :————.

9. (i) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
(ii) අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————.

10 ජාතිය :————.

11. ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන බව :————.

12. සුදුසුකම් :————.

(අ) ජ්‍යෙෂ්ඨ. පා. ස./අ. පො. ස. (සාමාන්‍ය පෙළ) :————.

(ආ) විභාගයේ මාධ්‍යය :————.

(ඉ) විභාග අංකය : ————.

(ඊ) සමත් වූ වර්ෂය :————.

(උ) විෂයයන් :————.

| පළමු වර (වර්ෂය) | දෙවැනි වර (ඉදිරිපත් වූයේ නම් වර්ෂය) |
|---|---|
| (1) | (1) |
| (2) | (2) |
| (3) | (3) |
| (4) | (4) |
| (5) | (5) |
| (6) | (6) |
| (7) | (7) |
| (8) | (8) |

(ඌ) ලබා ඇති සම්මාන සාමාර්ථ/සහ/හෝ විශිෂ්ඨ සාමාර්ථ ගණන :————.

(ii) සම්මාන සාමාර්ථ සහ/හෝ විශිෂ්ඨ සාමාර්ථ ලබා ඇති විෂයයන් :————.

| | |
|---|---|
| (1) | (5) |
| (2) | (6) |
| (3) | (7) |
| (4) | (8) |

13. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඒ සම්බන්ධ විස්තර පහත සපයන්න :————.

(1) දෙපාර්තමේන්තුවේ නම :————.

(2) දරණ ලද තනතුර සහ එම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ද යන බව :————.

(3) පත් වූ දිනය :————.

(4) අස් වූ දිනය සහ අස්වීමට හේතු :————.

(5) ගුරුවරයෙක් නම්, ලියාපදිංචි කිරීමේ අංකය සහ අන්තිමට සේවය කළ පාසල :————.

14. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර නොමැති බවත්, තනතුර අත්හැර ගිය අයෙකු සේ සලකා නැති බවත්, සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පික විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව උඩ සේවයෙන් විශ්‍රාම ගන්වා නැති බවත්, මා පරම්පරාවෙන්/ලියාපදිංචි කිරීමෙන් ලාංකිකයෙකු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුස්සෙකු කිරීමට යටත් බවත්, පත් කරනු ලැබුවායින් පසු ඒ බව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :......................

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ ප්‍රධානියා මඟින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි.)

.................................... ගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය.

......................................................
දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා හෝ ඒ වෙනුවට බලය ලත් නිලධාරියාගේ අත්සන.

තනතුර :..............................

ලිපිනය :..............................

දිනය :..................................

2–960—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරී තනතුර

ධීවර දෙපාර්තමේන්තුවේ පොළොන්නරුවේ පිහිටි මිරිදිය ධීවර ස්ථානයෙහි පර්යේෂණ නිලධාරී තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයන්හි ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 3, ගාලු මුවදොර ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර: 1973 මාර්තු මස 30 වෙනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර: 1973 මාර්තු මස 30 වෙනිදා.

**සටහන්.—**

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.—ශ්‍රී ලංකා ජනරජය** යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත්වීම කරනු ලැබේ. අයදුම්කරුවෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු අළුත් තනතුරෙහිද විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ලැබීමට තවදුරටත් හිමිකම් ලබනු ඇත. පළමුකොට ඔහු නියමිත කාලසීමාවකට වැඩ බැලීමේ තනතුරකට පත් කරනු ලබන අතර, එම තනතුර දැරීමට ඔහු නුසුදුසුයයි සලකනු ලැබුවහොත්, එම කාලය තුළදී ඕනෑම අවස්ථාවක ඔහු මුල් තනතුරට ආපසු පත් කරනු ලැබේ.

(ආ) මේ නිලධාරියාට අතිරේක පුහුණුවක් හා පළපුරුද්දක් ලබා ගනු සඳහා පිටරට යාමටද සිදු විය හැකිය.

(ඇ) පිටරට පුහුණු කරවීම පිණිස මේ නිලධාරියා තෝරා ගනු ලැබුවහොත්, එවිට පහත සඳහන් දේ පිළිබඳව ඔහු ශ්‍රී ලංකා ජනරජය සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

(ඈ) (i) අනිකුත් දේ අතර, නියමිත පුහුණුවීමේ පාඨමාලාවක් විශ්වාසදායක ලෙස අප්‍රමාදව හැදෑරීමටත්, එය සතුටුදායක ලෙස නිම කිරීමටත්, පුහුණුව නිම කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, නියමිත කාල සීමාවකට (ජනරජය විසින් නියම කළ යුතුවූ) ශ්‍රී ලංකා ජනරජයට සේවය කිරීමටත්, භාර ගැනීම, හා

(ඇ) (ii) ගිවිසුමේ වගන්ති හා කොන්දේසි අනුව, කටයුතු නොකළහොත්, (වැටුප් දීමනා, ගමන් වියදම් හාස්තු ආදී) සම්පූර්ණ පුහුණුව සඳහා ශ්‍රී ලංකා ජනරජය හා/හෝ අනිකුත් ප්‍රදානය කිරීමේ ආයතනයන් මගින් දරණ ලද පුහුණුවීමේ මුළු වියදම ආපසු ශ්‍රී ලංකා ජනරජයට ගෙවීමට භාර ගැනීම.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—රුපියල් 7,440 ඒකාබද්ධ වැටුපකින් පටන් ගෙන, රු. 360 බැගින්, වාර්ෂික වැඩිවීම් 10 කින් හා රු. 480 බැගින් වාර්ෂික වැඩිවීම් 11 කින් රු. 16,320 වාර්ෂික වැටුපට නගී. කාර්යක්ෂමතා කඩඉම් රු. 12,000 ට හා රු. 14,880 ට පෙර. තෝරාගනු ලබන අයදුම්කරු ස්වකීය විද්‍යා කටයුතු අංශය පිළිබඳව නියමිත පශ්චාත් උපාධියක් හෝ උසස් තත්ත්වයේ ඩිප්ලෝමාවක් හෝ ලබා නොගතහොත්, ඔහුට රු. 11,520 ක වාර්ෂික වැටුප් ඉක්මවා යැමට හැකි නොවනු ඇත.

සංලක්ෂ්‍යය :—

(i) සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී මූලික විද්‍යා උපාධියකට වඩා උසස් පී. එච්. ඩී. හෝ ඇම්. ඇස්. සී. හෝ වැනි උපාධියක් ඇති නිලධාරියෙකුට ආරම්භක වැටුප වශයෙන් වාර්ෂික රු. 8,520 ක් ගෙවනු ඇත.

(ii) තෝරා ගනු ලැබූ අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔහුට වැටුප් පිළිබඳ අනුග්‍රහයක් දීය යුතු නම්, ආයතන අධ්‍යක්ෂගෙන් විමසීමෙන් පසු ඔහු වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තබනු ඇත.

4. සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1973 මාර්තු මස 30 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව,

(ඇ) සත්ත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ඇති රසායන විද්‍යාව හෝ උද්භිද විද්‍යාව සහිතව සමත්, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුයි. (පළමුවැනි හෝ දෙවැනි පන්තියේ උපාධියක් ලබා ඇති අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

5. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.)

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(1) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(2) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එනෙකුදුවුවත්. තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදැදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ ධීවර අමාත්‍යාංශයේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ධීවර අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වෙනි කොටසේ 11 වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත එම අයදුම්පත ලැබුණ බව දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නොලැබුණු විට ඒ බව වහාම ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුයි.

ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 14 වෙනි දින,
කොළඹ 3,
ධීවර අමාත්‍යාංශයේ දී ය.

පොළොන්නරුවේ ධීවර පර්යේෂණ නිලධාරි තනතුර

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "පොළොන්නරුවේ පර්යේෂණ නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 3, තැ. පෙ. 1707, ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :—
(1973 ..............දිනට වයස : අවුරුදු :——, මාස :——, දින :————.

4. ජාතිය :————.

5. විවාහක ද, අවිවාහක ද යන බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :————.

7. වෘත්තීය සුදුසුකම් :————.

8. පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

(සේවය භාර ගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය.)

9. දැනට කරන රක්ෂාව :————.

10 චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නම් :————.

11. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් හා මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව, එම වරද දැන ගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට මා බැඳී ඇති බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–930—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඊඑස්. 1/16/73

ඉංජිනේරු සේවා මණ්ඩලය

ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරු තනතුරුවල පුරප්පාඩු

1973. 01. 19 වැනි දින අංක 43 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද මගේ නිවේදනවල දක්වා ඇති ඉහත සඳහන් පුරප්පාඩු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1973 මාර්තු 31 වැනි දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලය,
මහලේකම් ගොඩනැගිල්ල, කොළඹ 1.
1973 පෙබරවාරි මස 13 වැනි දින.

2–1005—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

### ආදර්ශ ඉල්ලුම්පත්‍රය

#### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1. ඉල්ලුම්කරන තනතුර :————.
2. සම්පූර්ණ නම (අගට යෙදෙන නම මුලින් සඳහන් කරන්න) : ————.
3. ලිපිනය :————.

*4. උපන් දිනය :————.

5. ඉල්ලුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනයට වයස :————. අවුරුදු :——, මාස :——, දින :————.
6. ජාතිය :————.

*7. සුදුසුකම් :————.

අධ්‍යාපනික (විෂයයන්, දිනයන් හා ආයතනයේ නම් සහිතව) :————.

වෘත්තීය (දිනයන් හා ආයතනයන්ගේ නම් සහිතව) : ————.

*8. නියුක්තව සිටි රැකියාවල විස්තර (ලැබුණු වැටුප් හා උසුලන ලද තනතුරුවල විස්තර සැපයිය යුතුය.) :————.

*9. පළපුරුදුකම් :————.

*10. විශේෂ සුදුසුකම් :————.

*11. සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද සියලු විස්තර සත්‍ය බවටත්, නිවැරදි බවටත් ඒ සම්බන්ධ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ හැකි බවටත් මම සහතික කරමි. මෙහි සඳහන් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව මා තනතුරට තෝරා ගැනීමට ප්‍රථම සොයා ගතහොත්, එයින් මා තනතුරට නුසුදුස්සකුවනු ලබන බවත්, පත් කිරීමෙන් පසු සොයාගතහොත් වන්දි නොගෙවා පහකරනු ලබන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*(අදාල ලියකියවිලි හා සහතිකවල පිටපත් ඉල්ලුම්පත්‍රය සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.)

2–935—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

#### පුරප්පාඩු

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයගේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. නම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබා ගන්නා ඉල්ලුම් පත්‍ර මගින් අයදුම් කළ යුතුය.

**විදුලි වැඩ නායක :**

**වැටුප් පරිමාණය.**—සියලු දීමනා අඩංගු මසකට රු. 450—14×25 රු. 800.

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සමාන සහතිකයක් සමග ජේ. ටී. ඕ. (විදුලි) සහතිකය හෝ පිළිගත් කාර්මික ආයතන යක සමාන සහතිකයක් ලබා තිබිය යුතු අතර, කර්මාන්ත ශාලාවක හෝ වැඩ පොලක හෝ අඩු වශයෙන් අවුරුදු තුනක විදුලි වැඩ පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම

හෝ

කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය සහිතව කර්මාන්ත ශාලාවක හෝ වැඩ පොලක අවුරුදු 12ක විදුලි වැඩ පිළිබඳ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් අඩුම වශයෙන් අවුරුදු 5 ක් පිළිගත් කර්මාන්ත ශාලාවක හෝ වැඩ පොලක හෝ පරිපාලන තත්ත්වයේ පළපුරුද්දක් විය යුතුය.

හෝ

පිළිගත් කර්මාන්ත ශාලාවක හෝ වැඩ පොලක විදුලි වැඩ පිළිබඳ අවුරුදු 15 ක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් අවුරුදු 8 ක් පරිපාලන තත්ත්වයේ විය යුතුය.

**උපකරණ කාර්මික ශිල්පී :**

**වැටුප් පරිමාණය.**—6 වන ශ්‍රේණිය—සියලු දීමනා සහිතව මසකට රු. 450—14×25—800.

7 වන ශ්‍රේණිය—සියලු දීමනා සහිතව මසකට රු. 350—15×20—650.

**සුදුසුකම්.**—6 වන ශ්‍රේණිය—ජේ. ටී. ඕ. සහතිකය හෝ ඒ හා සමාන පිළිගත් කාර්මික ආයතනයක විදුලි/යාන්ත්‍රික/ඉලෙක්ට්‍රෝනික් ඉංජිනේරු පිළිබඳ සහතිකයක් තිබීම.

7 වන ශ්‍රේණිය—උපකරණ පිළිබඳ පිළිගත් ඩිප්ලෝමාවක් තිබීම.

කර්මාන්ත විදුලි උපකරණ පිළිබඳ මනා දැනුමක් අවශ්‍යයය. තෝරා ගත් අයදුම්කරුවන් විසින් උපකරණ අලුත්වැඩියා කිරීම තමන් ම කිරීමට සමත් විය යුතුය.

තෝරා ගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වන වේතන පරිමාණවල සුදුසු පියවරක තැබීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් කන්තලේ, හිඟුරාණ හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මණ්ඩලයයේ ඕනෑම ආයතන යක සේවය කිරීමටද සූදානම් විය යුතුය. ඔහු විසින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් ද ලබා ගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි ප්‍රධානීන් මගින් අයදුම් පත් එවිය යුතුය.

අයදුම් පත් ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයය, තැ. පෙ. 1486. නො. 651, ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට 1973 මාර්තු මස 03 වෙනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1486,
651, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 5,
1973 පෙබරවාරි මස 13 වෙනි දින.

2–921—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### අධ්‍යාපන අමාත්‍යාංශය

#### ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල මණ්ඩපයන්හි සාමාන්‍ය ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධි සඳහාද, මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ හා දෙහිවල, ගාල්ල, යාපනය සහ මහනුවර, බහුතාක්ෂණිකායතනවල වාණිජ ඩිප්ලෝමා සහතිකය සඳහාද, කෘෂිකර්ම උපාධි විභාගය සඳහා ද, බහුතාක්ෂණිකායතන උපදේශක වරුන්ට, ගුරු විදුහල් අභ්‍යාසාචාර්යවරුන්ට සහ ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු—1973

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ, පේරාදෙණිය මණ්ඩපයේ හෝ කොළඹ මණ්ඩපයේ හෝ විද්‍යෝදය මණ්ඩපයේ හෝ විද්‍යාලංකාර මණ්ඩපයේ හෝ සාමාන්‍ය ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධි සඳහාද, මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ හා දෙහිවල ගාල්ල, යාපනය සහ මහනුවර බහුතාක්ෂණිකායතනවල වාණිජ ඩිප්ලෝමා සහතිකය සඳහා ද, කෘෂිකර්ම උපාධි විභාගය සඳහා ද, අභ්‍යන්තර පාඨමාලා අනුගමනය කිරීම පිණිස 1973 වර්ෂයේ ඇතුලත් කර ගැනීමට තෝරාගෙන තිබෙන්නා වූ පහත සඳහන් සුදුසුකම් ඇති බහුතාක්ෂණිකායතන උපදේශකවරුන්ගෙන්, ගුරු විදුහල් අභ්‍යාසාචාර්යවරුන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් අධ්‍යයන නිවාඩු සඳහා අයදුම්පත් භාරගන්නා බව, මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත්‍ර පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කර 1973 මාර්තු මස 15 වැනි දින හෝ ඊට පෙර පාඨශාලා ප්‍රධානියා මගින් ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ඉල්ලුම් පත්‍රය ඇතුළත් ලියුම්කවරය පිටපැත්තේ, වම් කෙළවරේ, "අධ්‍යයන නිවාඩු ඉල්ලීම—1973" යන වචන පැහැදිලිව ලිවිය යුතුය.

2. 1973 වර්ෂය සඳහා අභ්‍යන්තර පාඨමාලා අනුගමනය කිරීම පිණිස අධ්‍යයන නිවාඩු අනුමත කරනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇත්තන්ට පමණි.

(අ) 1973.1.1 වැනි දිනවන විට වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය.

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන් දෙකකින් සමත්ව එම විෂයයන් දෙක උපාධිය සඳහා හැදෑරිය යුතුය. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, ඉංග්‍රීසි හෝ කුණ්ඩසාලේ/පේරාදෙණිය කෘෂිකර්ම පාසල් සහතිකය/හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික විද්‍යාලයීය ඩිප්ලෝමා සහතිකය/සහ ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ, කෘෂිකර්ම පීඨය විසින් රජයේ දෙපාර්තමේන්තු වල සේවයෙහි නියුක්ත නිලධාරීන්ට කෘෂිකර්ම උපාධි විභාගය හැදෑරීමට පැවැත්වෙන විශේෂ විභාගයෙන් සමත් වී හෝ, අ. පො.ස. (උසස් පෙළ) විභාගයෙන්/යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වී, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පළමුවැනි වර්ෂයෙන් නිදහස්ව, කෘෂිකර්ම උපාධිය හැදෑරීමට තෝරාගෙන ඇති, එසේ නොමැති නම්, විශ්ව විද්‍යාලයීය ප්‍රථම යෝග්‍යතා පරීක්ෂණයේ දී හෝ මධ්‍ය පරීක්ෂණයේ දී හෝ යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන් එකකින් සමත්ව එම විෂය උපාධිය සඳහා ද හැදෑරිය යුතුයි :—

භූ විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, ඉංග්‍රීසි, භූගෝල විද්‍යාව.

සැ. යු.—ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධිය හා වානිජ ඩිප්ලෝමා සහතිකය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ට ඉහත 2(ආ) ඡේදය අදාළ නොවේ.

3. පහත සඳහන් තැනැත්තන්ට අධ්‍යයන නිවාඩු දෙනු නොලැබේ :—

(අ) 1973.1.2 වැනි දිනට යටත් පිරිසෙයින් අවුරුද්දකවත් සේවයක් නොමැති ගුරුවරු.

(ආ) කිසියම් විනයානුකූල පරීක්ෂණයක භාජන වී එම පරීක්ෂණ කටයුතු අවසාන කරනු නොලැබ සිටින්නන්.

(ඉ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල මණ්ඩපයන්හි හෝ/ලංකා කාර්මික විද්‍යාලයේ හෝ/බහුතාක්ෂණිකායතනයන්හි හෝ බාහිර පාඨමාලා හැදෑරීමට පමණක් ලේඛනගත වූවන්.

(ඊ) 1973 අධ්‍යයන වර්ෂය මුලදී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල මණ්ඩපයන්හි, අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස තෝරා නොගත් ගුරුවරු.

(උ) ගෞරව ශාස්ත්‍රවේදී හෝ පශ්චාත් උපාධි සඳහා හෝ පාඨමාලා හදාරණ ගුරුවරු (අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ ශාස්ත්‍රපති (අධ්‍යාපන විද්‍යාව), මේ තහනමට අදාළ නොවේ.

(ඌ) ඇපකරයකට බැඳී සිටින ගුරුවරු (ගුරු පුහුණුව සඳහා අට අවුරුදු අපකරයකට අතුළත් වූද, පුහුණුවීමේ වියදම් රු. 10,000 කට වැඩි නොවූද ගුරුවරු අධ්‍යයන නිවාඩු සඳහා පස් අවුරුදු බැඳුම්කරයකට අතුළත් වූවාක් සේ සලකනු ලබෙත්. ඒ අනුව දැනට අට අවුරුදු ඇපකරයකට ඇතුළත් වී ඇති එහෙත් 1973.1.1. දිනට අවුරුදු පහක් සම්පූර්ණ කර නැති, ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු දෙනු නොලැබේ).

(එ) කනිෂ්ඨ විශ්ව විද්‍යාලවල ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා පස් අවුරුදු බැඳුම්කරයකට යටත්ව, බඳවාගත් අය වලුන් දැනට ගුරු තනතුරුවලට පත්ව ඇති, එහෙත් ඔවුන් යටත් වූ බැඳුම්කරයෙන් 1973.1.1 දිනට අවුරුදු තුනක සේවයක් සම්පූර්ණ නොකළ ගුරුවරු.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අංකය : සාප/17/292/73.
1973 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

## සාමාන්‍ය ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී, ශාස්ත්‍රපති (අධ්‍යාපන) වානිජ ඩිප්ලෝමා සහතිකය සඳහාද, කෘෂිකර්ම උපාධිය සඳහා ද, අධ්‍යයන නිවාඩු අයදුම් පත්‍රය

1. (අ) සම්පූර්ණ නාම :————.

(ආ) තනතුරු නාමය :————.

(ඇ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ඈ) දැනට ලබන ඒකාබද්ධ මාසික වැටුප :————.

2. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි වූ අංකයක් වේ නම් එය : :————.

3. (අ) උපන් දිනය :————.

(ආ) 1973. 1. 1 දිනට වයස :————.

4. පෞද්ගලික ලිපිනය ————.

5. ගුරුවරයා සේවයේ නියුතු පාසලේ නාම සහ ලිපිනය :————.
(දිස්ත්‍රික්ක හඳුන්වන අක්ෂරය සමග)

6. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :————.

7. (අ) 1973.1.2 දින දක්වා සම්පූර්ණ සේවා කාල පරිච්ඡේදය :————.

අවුරුදු :———, මාස :———.

(ආ) 1973. 1. 1 දින දක්වා සේවා සටහන් :————.
(ශිෂ්‍ය ගුරු සේවා කාලය වෙනම සඳහන් කළ යුතුය.)

| | පාසල | සිට | දක්වා |
|---|---|---|---|
| (1) | ———— | ———— | ———— |
| (2) | ———— | ———— | ———— |
| (3) | ———— | ———— | ———— |
| (4) | ———— | ———— | ———— |
| (5) | ———— | ———— | ———— |

8. ගුරු විද්‍යාලයක අධ්‍යයන පාඨමාලාවක් ඔබ අනුගමනය කර තිබේ නම්, එහි පාඨමාලාවේ කාල පරිච්ඡේදය හා ගුරු විද්‍යාලයේ නම සඳහන් කරන්න :—

| ගුරු විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |

9. (එබඳු පාඨමාලාවක් අනුගමනය කර තිබේ නම්) ඒ වෙනුවෙන් බැඳුනු ඇපකරයේ කාල පරිච්ඡේදය :
සිට :————, දක්වා :————.

10. අන්‍ය කවර හෝ පාඨමාලාවක් අනුගමනය කර තිබේද? එසේ නම් එබඳු නිවාඩු කාල පරිච්ඡේදය සහ කවර කරුණු සඳහා ද යන වග සඳහන් කරන්න :————.

11. (එබඳු පාඨමාලාවක් අනුගමනය කර තිබේ නම්) ඒ සඳහා බැඳුනු ඇපකරයේ කාල පරිච්ඡේදය :————.
සිට :————, දක්වා :————.

12. දැනට ඔබ ගුරු විද්‍යාල පාඨමාලාවක් අනුගමනය කරන්නේ නම් එම පාඨමාලාව ඇරඹුණු දිනය හා ගුරු විද්‍යාලයේ නම සඳහන් කරන්න :————.

13. 1973 වර්ෂයේ දී ඇතුළත් කර ගැනීමට ඔබ තෝරාගන්නා ලද විශ්ව විද්‍යාල මණ්ඩපයේ/ලංකා කාර්මික විද්‍යාලයේ/බහුතාක්ෂණිකායතනයේ නම :————.

(එසේ තෝරාගත් බව දන්වන ලද ලිපියේ පිටපතක් මීට අමුණන්න).

14. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල මණ්ඩපයේ/ලංකා කාර්මික විද්‍යාලයේ/බහුතාක්ෂණිකායතනයේ දී ඔබ අනුගමනය කිරීමට අදහස් කරන අධ්‍යයන පාඨමාලාව සහ මාධ්‍යය :—

| | විෂයයෝ | මාධ්‍යය |
|---|---|---|
| (1) | ———— | ————. |
| (2) | ———— | ————. |
| (3) | ———— | ————. |
| (4) | ———— | ———— |

15. (අ) ලංකා කාර්මික විද්‍යාල ප්‍රවේශ විභාගය හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වූ වර්ෂය සහ සමත් වූ විෂයයන් :————.

(ආ) විශ්ව විද්‍යාලයීය ප්‍රථම යෝග්‍යතා පරීක්ෂණය හෝ මධ්‍ය පරීක්ෂණය හෝ සමත් වූ වර්ෂය සහ සමත් වූ විෂයයන් :————.

16. පාඨමාලාව ආරම්භ වන දිනය :————.

17. පාඨමාලාවේ කාල පරිච්ඡේදය :————.

18. (අ) ඉකුත් පස් වසර තුළ ඔබ කවර හෝ විනයානුකූල පරීක්ෂණයකට භාජන විද? එසේ නම්, ඒ පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් / අමාත්‍යාංශයෙන් ලද ලිපිවල යොමු අංක හා දින සඳහන් කරමින් විස්තර සපයන්න :————.

(ආ) ඔබට විරුද්ධව කවර හෝ විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වීමට නියමව තිබේ නම්, ඒ පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් / අමාත්‍යාංශයෙන් ලද ලිපිවල යොමු අංකය හා දින සඳහන් කරමින් විස්තර සපයන්න : ————.

ඉහතින් දී ඇති මගේ සේවා විස්තර සහ අනෙකුත් කරුණු සත්‍ය බවත්, නිරවද්‍ය බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

විද්‍යාලයාධිපති/මූල් ගුරුවරයාගේ අත්සන.

............................ විද්‍යාලය.

දිනය :————.

(අනවශ්‍ය වචන කපා හරින්න).

2–920—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

1972 නොවැම්බර් මස පවත්වනලද නොතාරිස් අවසාන විභාගය

මෙහි පහත නම් සඳහන් අයදුම්කරුවන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් පෙන්නුම් කරන භාෂාවෙන් නොතාරිස් වෘත්තියේ කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන විභාගයෙන් සමත් වී සිටින බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| නම | | | කටයුතුකරන භාෂා මාධ්‍යය |
|---|---|---|---|
| 1. ජී. ඩී. අල්විස් | ... | ... | සිංහල |
| 2. ටී. ඇම්. ඒ. පීරිස් | ... | ... | එම |
| 3. ඩබ්. ඇල්. දොන් දිනු | ... | ... | එම |
| 4. කේ. ආර්. ගුණතිලක | ... | ... | එම |
| 5. ඩී. පී. පී. ගුණතුංග | ... | ... | එම |
| 6. ජේ. ඒ. ජයකොඩි | ... | ... | එම |
| 7. ඩී. ඒ. ජයතිස්ස | ... | ... | එම |
| 8. ආර්. ඇෆ්. කල්දේරා මිය. | ... | ... | එම |
| 9. කේ. කේ. කුමාරසිංහ | ... | ... | එම |
| 10. එස්. මුණසිංහ | ... | ... | එම |
| 11. වයි. ආර්. පද්මසිරි | ... | ... | එම |
| 12. පී. ජී. ජේමපාල | ... | ... | එම |
| 13. ආර්. ඒ. ජී. එස්. රණතුංග මිය. | | ... | එම |
| 14 එස්. ඒ. සිමියොන් සිංඤෝ | ... | ... | එම |
| 15. ඒ. ජී. සීලවතී මිය. | ... | ... | එම |
| 16. ටී. බී. වතිගසූරිය මිය. | ... | ... | එම |
| 17. එස්. එච්. විමලවීර මිය. | ... | ... | එම |
| 18. එච්. ඒ. විජේපාල | ... | ... | එම |
| 19. ඩී. ජේ. එස්. විද්‍යාසේකර | ... | ... | එම |
| 20. ඇම්. ඇස්. පෙරේරා | ... | ... | එම |
| 21. ඩබ්. ඒ. සේනන් | ... | ... | එම |
| 22. ඇම්. විමලතුංග | ... | ... | එම |
| 23. ඩබ්ලිව්. සමරවීර | ... | ... | එම |
| 24. අමරා සපුකොටන මිය. | ... | ... | එම |
| 25. ඒ. ඩී. අඹදෙණිය | ... | ... | එම |
| 26. ඇග්නස් විජේන්ද්‍රා මිය. | ... | ... | එම |
| 27. එල්. කේ. යූ. ජයතිලක | ... | ... | එම |
| 28. එස්. එම් ධනපාල | ... | ... | එම |
| 29. ඒ. ඩී. චන්ද්‍රසේන | ... | ... | එම |
| 30. එස්. ඩී. ඒ. වණිගසේකර මිය. | | ... | එම |
| 31. එම්. ඩබ්. දයාවතී මිය. | ... | ... | එම |
| 32. යූ. කේ. ආර්. සේනානායක | ... | ... | එම |
| 33. ඩබ්. ඇස්. සිල්වා | ... | ... | එම |
| 34. ඩී. ඩබ්. ද සිල්වා | ... | ... | එම |
| 35. ජේ. ඒ. කුලරත්න | ... | ... | එම |
| 36. ජී. බී. ජයවර්ධන | ... | ... | සිංහල |
| 37. ඇම්. ඒ. පුංචිඅප්පුහාමි | ... | ... | එම |
| 38. ටී. යාපාබණ්ඩාර | ... | ... | එම |
| 39. ආර්. බෝවේගොඩ | ... | ... | එම |
| 40. ඩී. ඩබ්. පී. අල්ගම | ... | ... | එම |
| 41. ඒ. පී. ඇලෙක්සැන්ඩර් | ... | ... | එම |
| 42. ඒ. බී. චන්ද්‍රලතා මිය. | ... | ... | එම |
| 43. කේ. පී. එස්. විමලරත්න | ... | ... | එම |
| 44. ආර්. එස්. කේ. චන්ද්‍රකාන්ති මිය. | | ... | එම |
| 45. එන්. ඒ. ද සිල්වා | ... | ... | එම |
| 46. බී. සී. එම්. ප්‍රනාන්දු | ... | ... | එම |
| 47. පී. ඩී. ආර්. සී. පොන්සේකා | ... | ... | එම |
| 48. එම්. එල්. ඤාණසේන | ... | ... | එම |
| 49. එච්. හදිඤ්ඤාපොළ | ... | ... | එම |
| 50. එච්. එම්. පී. හේරත් | ... | ... | එම |
| 51. කේ. ජී. පී. ඩබ්. ජයතිලක | ... | ... | එම |
| 52. එන්. ටී. ජයවර්ධණ | ... | ... | එම |
| 53. එම්. ඩී. ජිනවරදාස | ... | ... | එම |
| 54. ඇම්. ඩී. අයි. ලියෝ | ... | ... | එම |
| 55. එච්. ඇම්. මිල්ටන් | ... | ... | එම |
| 56. ඒ. ජී. සී. නානායක්කාර | ... | ... | එම |
| 57. වයලට් පණ්ඩිත මිය. | ... | ... | එම |
| 58. පී. එම්. ටී. පතිරාජ | ... | ... | එම |
| 59. ඒ. එස්. පීරිස් | ... | ... | එම |
| 60. එච්. ආර් රාමවික්‍රම | ... | ... | එම |
| 61. ඩබ්. එම්. එන්. රාමවික්‍රම මිය | ... | ... | එම |
| 62. ඩී. ඩබ්. උඩවත්ත | ... | ... | එම |
| 63. එස්. ඩී. එල්. සත්දනායක | ... | ... | එම |
| 64. ඩී. බී. ආර්. සමරනායක | ... | ... | එම |
| 65. ඩී. සමරතුංග මිය. | ... | ... | එම |
| 66. ආර්. පී. සුබසිංහ | ... | ... | එම |
| 67. ඩබ්. ඩී. සිල්විනු | ... | ... | එම |
| 68. ඒ. ඩී. වැලන්ටයින් | ... | ... | එම |
| 69. ඇම්. ඩී. එච්. වීරතුංග | ... | ... | එම |
| 70. ඩබ්. යාපාරත්න | ... | ... | එම |

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
1973 පෙබරවාරි 07.

හමීඩ් ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2–924—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඉවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 73. 1. 5 සිකුරාද | ... | 72.12.27 බදාදා | දවල් 12.00 |
| | | 73. 1.12 සිකුරාද | ... | 73. 1. 3 බදාදා | දවල් 12.00 |
| | | 73. 1.19 සිකුරාද | ... | 73. 1.10 බදාදා | දවල් 12.00 |
| | | 73. 1.26 සිකුරාද | | 73. 1.17 බදාදා | දවල් 12.00 |
| පෙබරවාරි | ... | 73. 2. 2 සිකුරාද | ... | 73. 1.24 බදාදා | දවල් 12.00 |
| | | 73. 2. 9 සිකුරාද | ... | 73. 1.31 බදාදා | දවල් 12.00 |
| | | 73. 2.15 බ්‍රහස්පතින්දා | ... | 73. 2. 7 බදාදා | දවල් 12.00 |
| | | 73. 2.23 සිකුරාද | ... | 73. 2.14 බදාදා | දවල් 12.00 |
| මාර්තු | | 73. 3. 2 සිකුරාද | ... | 73. 2.21 බදාදා | දවල් 12.00 |
| | | 73. 3. 9 සිකුරාද | ... | 73. 2.28 බදාදා | දවල් 12.00 |
| | | 73. 3.16 සිකුරාද | ... | 73. 3. 7 බදාදා | දවල් 12.00 |
| | | 73. 3.23 සිකුරාද | ... | 73. 3.14 බදාදා | දවල් 12.00 |
| | | 73. 3.30 සිකුරාද | ... | 73. 3.21 බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73. 4. 6 සිකුරාද | ... | 73. 3.28 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.11 බදාදා | ... | 73. 4. 4 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.19 බ්‍රහස්පතින්දා | ... | 73. 4.11 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.27 සිකුරාද | ... | 73. 4.18 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. සිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.